ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී උපාධි පාඨමාලාව - 5 වන මට්ටම

අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය I - 2015/2016

**LWU2314 – ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය II**

කාලය - පැය එකයි.

---

දිනය - 2016 නොවැම්බර් 03 වන දින        වේලාව - ප.ව.01.30 - ප.ව.02.30 දක්වා

---

අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩුකරනු ලැබේ.

එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.

01. "සිතීමේ නිදහස යනුවෙන් අදහස් වනුයේ සෑම මිනිසෙකුට ම තමන් කැමති ලෙස සිතීමේ නිදහස ඇති බවත්, ආගම හා සදාචාරය පිළිබඳව තම මත දැරීමට නිදහස ඇති බවත් ය."

A.S.Chaudri, *Law of Writs and Fundamental Rights* (Law book Co, Allahabad 1958)

ඉහත ප්‍රකාශය 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 10 වන වගන්තිය අනුසාරයෙන් විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න. අදාල නඩු තීන්දු ගෙන හැර දක්වන්න. (ලකුණු 20)

02. ශ්‍රී ලංකාවේ ස්වේච්ඡා සංවිධානයක සේවය කරන සිය පෙම්වතා වන ෂේන් මුණ ගැසීම සඳහා එලිනා ජර්මනියේ සිට පැමිණියා ය. එලිනාට රට වටා සංචාරය කිරීමට අවශ්‍ය වූ අතර ඔවුහු ෂේන්ගේ යතුරු පැදියෙන් එලෙස සංචාරය කිරීමට තීරණය කල හ. එලිනාට මුහුදේ පිහිනීමට අවශ්‍ය වූ බැවින් ඔවුන් පලමු දිනයේ ආරුගම්බේ වෙරළ තීරය බලා පිටත්ව ගියෝ ය. ඔවුන් මුහුදේ නෑමට සූදානම් වෙමින් සිටින අතරතුර පුද්ගලයන් කණ්ඩායමක් ඔවුන් දෙසට පැමිණි අතර ඒ අතර සිටි එක් අයෙක් තමා සමඟ මුහුදේ පිහිනීමට පැමිණෙන ලෙස එලිනාට බලකර සිටියේ ය. මේ අතර එතැන මිනිසුන් 15 ක් පමණ සිටින බවත් ඔවුන් සියලු දෙනා බීමතින් සිටින බවත් ෂේන් අවබෝධ කර ගත්තේ ය. එක් අයෙක් ඔහුගේ යට ඇඳුම ඉවත් කර සිය නිරුවත එලිනාට පෙන්වමින් සිටි අතර තවත් අයෙක් එම සිදුවීම ඡායාරූප ගත කරමින් සිටියේ ය. ෂේන් සන්සුන්ව ඡායාරූප ගනිමින් සිටි පුද්ගලයා අසලට පියමං කර, ඔහුගෙන් කාරුණිකව ඉල්ලා සිටියේ තම පෙම්වතියගේ ඡායාරූප තමන් ඉදිරියේ ම මකා දමන ලෙසයි. ෂේන් ව වැරෙන් පසකට තල්ලු කර දැමුණු අතර පිරිස ඔහුට පහර දීමට පටන් ගත් හ. ෂේන්ව බේරා ගැනීමට පැමිණි එලිනාට ද වෙරළේ සිටි සංචාරකයන් ඉදිරිපිටම ඔවුන් විසින් පහර දෙන ලදි. ෂේන්ගේ හිසට, මුහුණට සහ උදරයට දැඩි ලෙස පහර එල්ල විය. එලිනාගේ කම්මුලට පහර දුන් අතර නින්දිත ලෙස බැණ වැදුණි. පහරදුන් පුද්ගලයන් කණ්ඩායම කෑගසමින් පවසා සිටියේ ඔවුන් එක්තරා ඇමතිවරයකුගේ ඇමති ආරක්ෂක අංශයට (MSD) අනුයුක්තව සිටින ස්ථිර ආරක්ෂක නිලධාරීන් බවත්, ෂේන්ට සහ එලිනාට වෙඩි තබා මරා දැමීමට ඔවුන්ට හැකියාව ඇති බවත් ය.

ෂේන් සහ එලිනා 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන වගන්තිය ප්‍රකාරව මූලික අයිතිවාසිකම් කඩ කිරීම යටතේ නඩු පැවරීමට ඔබගේ උපදෙස් පතයි.

ඔවුනට උපදෙස් දෙන්න. අදාල නඩු තීන්දු ඇසුරින් ඔබගේ පිළිතුර තහවුරු කළ යුතුය.

(ලකුණු 20)



හිමිකම් ඇවිරිණි.

**THE OPEN UNIVERSITY OF SRI LANKA**

**FACULTY OF HUMANITIES AND SOCIAL SCIENCES**

**DEPARTMENT OF LEGAL STUDIES**

**LL.B DEGREE PROGRAMME – LEVEL 4**

**CONTINUOUS ASSESSMENT TEST I– 2015/2016**

**LWU2314 – CONSTITUTIONAL LAW II**

**DURATION: 01 HOUR.**

**DATE: 03rd November 2016** **Time: 1.30 p.m. – 2.30 p.m.**

**Answer one (01) question only.**

**Candidates will be penalized for illegible handwriting.**

01) "Freedom of conscience means that every man is free to think his own thoughts and to have his own opinion about religion and morality"
A.S Chaudri, *Law of Writs and Fundamental Rights* (Law Book Co, Allahabad 1958)

Critically analyze the above statement with reference to the Article 10 of the Constitution of 1978. You are required to cite the relevant case law. (20 marks)

02) Elina came from Germany to meet her boyfriend, Shane who was working at a voluntary organization in Sri Lanka. Elina wanted to travel all over the country and they decided to do so on Shane's motor bike. First day, they went to Arugambay beach since Elina wanted to have a swim. While they were getting ready, a gang of men came towards them and one of them forced Elina to swim with him. Meanwhile, Shane noticed about fifteen (15) people standing there, all of them drunk; one person had removed his swimming trunk and was indecently exposing himself to Elina while another man was taking photographs. Shane slowly walked up to the photographer and politely asked him to delete his girlfriend's photos in front of him. Shane was violently shoved aside and at that point the gang started assaulting Shane. Elina who came to save him was also assaulted in front of the tourists who were on the beach. Shane got severe blows to his head, face and stomach. Elina was also slapped and abused. The gang shouted at them that they were permanent security officers of a particular minister attached to the Ministerial Security Division (MSD) and they could shoot and kill both Shane and Elina.

Shane and Elina seek your advice to file a fundamental right violation case under the Article 11 of the Constitution of 1978.

Advise them. Your answer should be supported with the relevant case law.

(20 marks)

- *Copyrights reserved* -